සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

පිළිතුරු පත්‍රය
Marking Scheme

ශ්‍රේණිය / தரம் / Grade: 10
විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව
පත්‍රය / வினாத்தாள் / Paper: I,II

## නාට්‍ය හා රංග කලාව I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 2 | (11) | 3 | (21) | 2 | (31) | 3 |
| (2) | 3 | (12) | 2 | (22) | 3 | (32) | 1 |
| (3) | 3 | (13) | 2 | (23) | 2 | (33) | 2 |
| (4) | 4 | (14) | 4 | (24) | 1 | (34) | 2 |
| (5) | 2 | (15) | 3 | (25) | 2 | (35) | 1 |
| (6) | 1 | (16) | 2 | (26) | 2 | (36) | 2 |
| (7) | 2 | (17) | 4 | (27) | 2 | (37) | 1 |
| (8) | 4 | (18) | 4 | (28) | 2 | (38) | 4 |
| (9) | 2 | (19) | 2 | (29) | 3 | (39) | 3 |
| (10) | 1 | (20) | 3 | (30) | 2 | (40) | 4 |

## නාට්‍ය හා රංග කලාව II

(01) (1) පුණ්‍ය සේන ගුණසිංහ (ලකුණු 02)

(2) නාට්‍ය ධර්මී (ලකුණු 02)

(3)
- දෙබස් ස්වභාවිකත්වයෙන් තොර බව.
- ගීතවත් බව.
- කාව්‍යමය භාෂාවකින් යුක්ත බව.
- පසුතලය වාචික අභිනයෙන් දක්වයි.
- එකවර වේදිකාවේ අවස්ථා කිහිපයක් නිරූපණය කිරීම ආදී වශයෙනි. (ලකුණු 02)

(4) දිකතල, කාලගෝල, දික්පිටියා, මහොෂධ පඩිතුමා (ලකුණු 02)

(5) මද්දලය (ලකුණු 02)

(6) එහි ඇතුලත් ගීතයක මුල් කොටස ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)

(02) (1) නෘත්ත යනු අංග වික්ෂේප භාවිතා කරන, රිද්මයානුකුල හා ශෝභමාන දෘෂ්‍ය රූපයක් සහිත තාලාන්විත නැටුමකි. කිසිඳු අර්ථයක් නොමැති නර්තනයක් පමණි.
නිදසුන් : ලී කෙළි, කළගෙඩි (ලකුණු 02)

(2)
- නෘත්‍ය යනු රංගනය මගින් කිසියම් අර්ථයක් හෝ භාවයක් දක්වෙන

තාලාන්විත නර්තනයකි. ආංගික, සාත්වික, ආහාර්ය අභිනයන් භාවිතා වේ.
නිදසුන් ඃ භරත නාට්‍ය , මුද්‍රා නාට්‍ය

- නෘත්තයේ දී අර්ථයක් හෝ භාවයක් ප්‍රකාශ නොවේ. ආංගික අභිනය භාවිතා කරමින් සිදුකරන තාලාන්විත නර්තනයකි.
  නිදසුන් ඃ කළගෙඩි , ලී කෙළි (ලකුණු 04)

(3) විශේෂයෙන් තෝරාගත් කථා පුවතක්, සිදුවීමක් හෝ අවස්ථාවක් තේමා කරගත් සංවාද ඇතුළත් ප්‍රබල පෙළක් සහිතව, සතර අභිනය මඟින් අපූර්ව අවස්ථාවන්ගෙන් යුක්තව නරඹා රසවිඳින්නට තිබෙන්නකි.
පෙළ රචක, නිෂ්පාදක, පාත්‍ර වර්ගයා, වෙස් සැලසුම්කරු, පසුතල නිර්මාණ, පෙළ මතක් කරන්නන් ආලෝක ශිල්පීන්, අංග රචනා ශිල්පීන්, සංගීතඥයින්, නර්තන ශිල්පීන් ආදින්ගේ දායකත්වය පිළිබඳව සාකච්ඡා කළ යුතු ය. (ලකුණු 06)

(03) (1) රූපණය යනු චරිතයකට ආරෝපණය වී කිසියම් කාල සීමාවක් එහි ජීවත්වීමයි. (ලකුණු 02)

(2) වෙහෙසීම, අමාරුකම් නොගැනීම, දැඩි ආත්ම ශක්තිය, හොඳ පුහුණුවක් සිදු කිරීම, අභ්‍යන්තරික (සිත) ප්‍රකාශනයකි, ශරීරය හා කටහඬ හසුරුවා ගැනීම, ඉවසීමෙන් කටයුතු කිරීම. (ලකුණු 04)

(3)
- යමෙකුගේ ස්වභාවය කර පෙන්වීම අනුකරණයකි.
- රූපණය යනු විවිධ චරිතයන් අනුකරණය කිරීමයි.
- චරිතයක් අනුකරණය කිරීමේ දී සතර අභිනය භාවිත කරමින් අනුකරණයේ යෙදීමට පුහුණු වීම රූපණ ක්‍රියාවලියට ඉතා වැදගත් වේ.
- නළුවන් වෙනත් චරිතයකට ප්‍රවේශ වීම සමාරෝපයයි.
- නළුවා ර ූපණය කරන චරිතය ඇඳුම් පැලඳුම් වලින් හා අංග රචනයෙන් පෙන්වා දීම බාහිර සමාරෝපයයි.
- නළුවා රඟන චරිතය ක්ෂණිකව හඳුනාගැනීමට භාහිර සමාරෝපය වැදගත් වේ.
- චරිතයට අවශ්‍ය පරිදි කටහඬ හා ශරීරාංග යොදාගෙන අභිනය පෑම අභ්‍යන්තර සමාරෝපයයි.
- රංගනය සාර්ථක වන්නේ සමාරෝපය සාර්ථකව සිදුකිරීමෙනි. (ලකුණු 06)

(04) (1) නාට්‍යයක් සාර්ථක කර ගැනීම සඳහා බාහිරින් යොදා ගන්නා සියලු ම කලාවන් ආනුෂංගික කලා වේ. (ලකුණු 02)

(2) සංගීතය, නර්තනය, වේෂභූෂණ, අංග රචනය, පසුතල නිර්මාණය, රංග භාණ්ඩ, ආලෝකකරණය මින් 04ක් (ලකුණු 04)

(3)
- නාට්‍යයේ චරිතවල බාහිර ලක්ෂණ ඉස්මතු කිරීම සඳහා වේෂ භූෂණ හා අංග රචනය යොදා ගන්නා බව
- නාට්‍යයේ මුඛාර්ථය වඩාත් අර්ථවත් කිරීම සඳහා පසුතල නිර්මාණ යොදා ගනී.
- වඩාත් චමත්කාර ජනක ලෙස ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ගායනය, සංගීතය හා නර්තනය යොදා ගන්නා බව.
- නාට්‍යයේ ප්‍රකාශනය වඩාත් අර්ථවත් කිරීම සඳහා ආලෝකය යොදා ගන්නා බව.
- රූපණ කාර්යයේ දී නළුවාට නාට්‍යෝපකරණ අවශ්‍ය වන බව.
  ලියා ඇති ආකාරය අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

(05) (1)
- චිත්ත ඒකාග්‍රතා අභ්‍යාසය

- ශිථිලකරණ අභ්‍යාස
- ශ්වසන අභ්‍යාස
- සංවේදන අභ්‍යාස
- කටහඬ අභ්‍යාස (ලකුණු 03)

(2) ශිෂ්‍යයා රංග අභ්‍යාස සිදුකරන ආකාරය නිවැරදිව ලියා ඇත්නම් අදාළ ලකුණු පිරිනමන්න. (ලකුණු 03)

(3)
- ශ්වසන අභ්‍යාස - හඬ පාලනය කිරීමේ හැකියාව ලැබීම
- ශිථිලකරණ අභ්‍යාස - රංගනයේ දී කායික හා මානසික සැහැල්ලු බව ඇතිකර ගැනීම
- සංවේදන අභ්‍යාස - ඉන්ද්‍රියයන් මුල්කරගෙන හැඟීම් නිරූපණය කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව සිදුකිරීමට හැකිවීම
- චිත්ත ඒකාග්‍රතා අභ්‍යාස - රූපණයේ දී චිත්ත ඒකාග්‍රතාවය ඇති කර ගැනීමට හැකිවීම
- කටහඬ අභ්‍යාස - විවිධ හඬ පරාසයන් පුහුණු කර ගැනීම හා නිවැරදිව හඬ පාලනය කිරීමට හැකිවීම

ආදී වශයෙන් විස්තර කිරීම සඳහා (ලකුණු 06)

(06) (1) කතන්දරයක් යනු කියවා සහ අසා රසවිඳීමට තිබෙන සිද්ධි මාලාවක් සහිත, ඇතැම්විට සංවාද ඇතුළත් දීර්ඝ කතා පුවතක් සහිත වූවකි. (ලකුණු 03)

(2)
- කතන්දරය කියවා සහ අසා රස විඳින්නකි. නාට්‍ය නරඹා රස විඳීමට තිබෙන්නකි.
- කතන්දරය ඇතැම්විට සංවාද ඇතුළත් දීර්ඝ කතා පුවතක් සහිත වූවකි. නාට්‍යයක කතා වස්තුවේ විකාශය කෙටි කාලීන වේ.
- කතන්දරය ශ්‍රව්‍ය මාධ්‍යයකි. නාට්‍ය ශ්‍රව්‍ය හා දෘෂ්‍ය මාධ්‍යයකි.

ආදී වශයෙන් කරුණු දක්වීමට (ලකුණු 03)

(3)
- නාට්‍ය කලාවේ සජීවී බව
- රංග කාලයෙහි සහ අවකාශ භාවිතයෙහි සීමාසහිත බව
- වේදිකාව මත රූපණය කළ හැකි දේ පමණක් තෝරා ගැනීම
- චිත්‍ර, සංගීතය, නර්තනය වැනි කලා මාධ්‍යයන් නාට්‍ය හා දායක කර ගැනීම
- ඍජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබීම
- ගබඩාකර තබාගත නොහැකි වීම
- සක්‍රීය ප්‍රේක්ෂක සහභාගිත්වය
- නැවත නැවතත් නිර්මාණය වෙනස් කළ හැකිවීම
- සෑම දර්ශන වාරයක ම නාට්‍ය නිෂ්පාදනයට දායක වූ පිරිස් ප්‍රතිලාභ ලැබීම (ලකුණු 06)

(07) (1) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04)

(2) සංවාද සහ රංග විධාන සහිතව පෙළ රචනා කිරීම (ලකුණු 08)

(ලකුණු 12)